පසුගිය දෙසැම්බර් මස අග දී දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා රැස්වීම අමතා නාගරික මන්ත්‍රී ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න කළ කතාව.




දේශපාලනයේ දී අප කොතරම් වාද විවාද කළත්, අවසානයේ දී අප හොඳ සිතින් මනුෂ්‍යයන් වශයෙන් සිටිය යුතුයි. වසර ගණනාවක් දේශපාලනය කර මන් දන්නා කාරණයක් ඒක. හිටපු නගරාධිපතිනියගේ කථාවේ අඩංගු සමහර කරුණු සිදු නොවුනා නම් හොඳයි. මන් දේශපාලනයට පැමිණ ටික කාලයකදීම දරුණු මර්ධනයන්ට හසුවී සිරගතවී සිටියා. තවත් කාලයක් සැඟවී සිටියා. නමුත් ඊට පසු කාලයකදී එම මර්ධනය කල පක්ෂයේ ම නායකයන් සමඟ සුහදව පලාත් සභා පිහිටුවීමට සාකච්ඡා කළා. ඒ අනුව බැලුවහම එක් එක්කෙනා අතර ඇති වාද විවාද එතරම් දුර ගෙන යා යුතු නැති බව පේනව. එක් එක් අයගේ ප්‍රතිපත්ති සමග ගැටීමට සිදු වුවත්, තමුන් මනුෂ්‍යයන් ලෙස නිකම් හිත් රිදවීම් නොකල යුතුයි. එම නිසා එතුමියගේ ඉල්ලීම් වලට එකග' විය යුතුයි කියා මා සිතනව. එසේම මා ළග'දී රත්මලාන ප්‍රදේශයේ සාකච්ඡාවකට සහභාගී වුනා. එතැනදී ඔවුන් පැවසුවේ පොලිසියෙන් සිදුවන කරදර හා හිංසා පිළිබද'වයි. තවද අප ප්‍රදේශයට අයත් නොවුනත් අග,ලාන ප්‍රදේශයේ පොලිසියෙන් සිදුවූ අපරාධ කිහිපයක් හෙළිදරව් වී තිබෙනවා.

එසේම නගරාධිපතිතුමාට මේ ප්‍රදේශයේ තිබෙන පොලිසිවල අවනත භාවයක් තිබෙනව. එය නගර සභාවේ සුපරීක්ෂණයක් හෝ පොලිසිවල කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ නිල අයිතියක් උඩ නොවේ. ඔබ තුමාට තිබෙන විශේෂ සම්බන්ධතාවයන් මත අද පොලිසි සමඟ කටයුතු කිරීමේ හැකියාව ලබා තිබෙනව. එසේ වුවත් අද ලෝකයේ පොලිස් බලතල ප්‍රධාන ආණ්ඩුවෙන් ඈතට ගෙන ගොස් නගර සභාවලට පවරා දෙන තත්ත්වයක් උදා වී තිබෙනව. උදාහරණයක් වශයෙන් ගතහොත් යුරෝපයේ පොලිස් බලතල ප්‍රාන්ත වලට භාරදිය යුතුය කියන තැනට එහා ගොස් නගර සභා වලට දිය යුතුය කියන තත්ත්වය දක්වා ගමන් කර තිබෙනව. එංගලන්තයේ නැතිනම් බ්‍රිතාන්‍යයේ ප්‍රාන්තයක් ලෙස නොගෙන මුළු රටම එක්සත් රාජධානිය හැටියට පසුගිය කාලයේ එකම පොලිස් ක්‍රියාමාර්ගයක් ගන්නා තත්ත්වයෙන් තිබුනා. ඒත් දැනට අවුරුදු 10 කට පෙර ඒ අය එම බලතල විමධ්‍යගත කර බලය බෙදා එංගලන්තය හා වේල්සය එක කොට්ඨාශයක් හැටියටත්, ස්කොට්ලන්තය තව කොට්ඨාශයක් හැටියටත්, උතුරු අයර්ලන්තය තව කොට්ඨාශයක් හැටියටත්, පොලිස් කොට්ඨාශ තුනකට බෙදා වෙන වෙනම ආයතන ගත කර තිබෙනවා. ලන්ඩන් නගරය නගරයක් හැටියට සළකා එහි මෙට්‍රොපොලිටන් නැමැති පොලිස් සංවිධානය සඳහා නගර සභාවන් 12 දෙනෙකුද, නගරයේ සිටින නඩුකාරවරුන් හා මහේස්ත්‍රාත්වරුන් සමඟ ස්වාධීන පුද්ගලයන් 07 දෙනෙකු පත් කරනව. මෙහි වැඩි බලයක් තිබෙන්නේ නගර සභාවේ මන්ත්‍රීන්වරුන්ටයි.

පසුගිය වකවානුවේ දී කෙන් ලිවින්ස්ටන් නැමැති නගරාධිපතිවරයා මෙම නගර සභාවට පත් වුනා. ඊට පසු නගරය තුළ කිසිම කෙනෙකුට පාස්පෝට් පරීක්ෂා කරන්න අයිතියක් නැතැයි කියා ඔහු විසින් නීතියක් ඇති කළා. පොලිසියෙත් කාටවත් පාස්පෝට් පරීක්ෂා කරන්න එපා කියා දැනුම් දුන්නා. ඒ ආකාරයට පොලිසිය කටයුතු කරගෙන ගිය නමුත් ඔහු පැරදුනා. පසුගිය අවුරුද්දේ දී සම්මන්ත්‍රණයකට ගිය අවස්ථාවේ දී මාහට මේ කෙන් ලිවින්ස්ටන් හමු වුනා. එම සභාවේ කෙන් ලිවින්ස්ටන් ද එක් කථිකයෙක් හැටියට කතා කලා. මේ අනුව එංගලන්තය වැනි රටක පොලිසි බලතල පවා පහලට බාර දී තිබෙනවා. ලංකාවේ ද පොලිස් බලතල පළාත් වලට ලබාදිය යුතුය යන අදහස ව්‍යවස්ථාවට ඇතුල් කර තිබෙනවා. නමුත් මෑත සිට සමහර ආණ්ඩුවේ අය පොලිස් බලතල පළාත් සභාවට දිය යුතුය යන වගන්තිය ඉවත් කල යුතුයි කියා කියනවා. එහෙත් උගත් පාඩම් හා සංහිඳියාව පිළිබඳ කොමිෂන් වාර්තාවේ එම බලතල පළාත් සභාවට දිය යුතු බව කියැවෙනව. ඒ වාර්තාව ක්‍රියාත්මක කරන බවට පාර්ලිමේන්තුව තුලත් රජය පිළිගෙන තියෙනවා. මේ නිසා මෙහි පරස්පර විරෝධී තත්ත්වයක් ඇතිවී තිබෙන බව පේනව.

කෙසේ හෝ පොලිස් බලතල විමධ්‍යගත කලහොත් නගර සභාවක් හැටියට අපට තිබෙන බලතල වැඩි වෙනව. පෞද්ගලිකව නගරාධිපතිතුමාට තිබෙන බලය නිසා අද අපට යම් දෙයක් කර ගැනීමට පුළුවන්. ඒ වුනත් සෑම මන්ත්‍රීවරයෙකුටම යම්කිසි ආකාරයකට බලතල වල කොටසක් ලැබෙන ආකාරයට නීත්‍යානුකූල ආකාරයට බලය පවරා ගැනීමක් කර ගත යුතුව තිබෙනවා. 1944 වර්ෂයේ ගම් සභා තියෙන විට පොලිස් කොස්තාපල්වරයෙකුට කාටද ගරු කල යුත්තේ කියා පොලිස් උපදෙස් පොතේ සඳහන් වෙනව. එහි උසස් පොලිස් නිලධාරීන්ට, උසස් හමුදා නිලධාරීන්ට හා මෙම්බර් මහත්වරුන්ට ආචාර කළ යුතු යැයි සඳහන් වෙනව. මේ අනුව මෙම්බර් මහත්වරුන්ගේ තත්ත්වය එදා සිට අද දක්වා බලනවිට පහලට වැටී තිබෙනව. එම නිසා නගර සභාවට බලතල ලැබෙන ආකාරයට බලය විමධ්‍යගත කිරීම උතුරේ ප්‍රශ්නයක් පමණක් නොවෙයි. පහල සභාවල බලය ශක්තිමත් කර ගැනීම අප කාටත් වැදගත් මෙන්ම අවශ්‍ය වෙනව.

පසුගිය දින ගරු නගරාධිපතිතුමා සහ නාගරික කොමසාරිස්තුමා සහභාගී වූ වැඩ සටහනක් ස්වර්ණවාහිනී නාලිකාවේ විකාශය වුනා. එහි දී පැයක් තුල එතුමන්ලා ඉතාමත් හොඳට කරුණු කාරණා පැහැදිලි කලා. කොමසාරිස්තුමා විසින් න්‍යාය පැහැදිලි කරන විට නගරාධිපති තුමා විසින් ඒක භාවිතාවට එන හැටි ලස්සන කර කිව්ව. රූපවාහිනී වැඩ සටහන් වලදී කතාව පමණක් නොවෙයි. එය ප්‍රසන්න වේදිකාවක් බවට පත් කළ යුතුයි. ඒකත් ඉතාමත් හොඳට ඉඩු වුනා.

කොමසාරිස්තුමා විසින් න්‍යාය විස්තර කරන විට අනෙක් පැත්තෙන් නගරාධිපතිතුමා විසින් වැඩ කිරීමේ කරුණු පැහැදිලි කරමින් වැඩ සටහන ඉදිරිපත් කලා. නියෝජ්‍ය නගරාධිපතිතුමාද එවැනි වැඩ සටහන් වලට යා යුතු යැයි මා විශ්වාස කරනවා. අද වන විට උගත් පාඩම් කොමිෂන් වාර්තාව පිළිබඳව දැනට ලෝකය තුල විශාල ආන්දෝලනයක් ඇති වී තිබෙනව. එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පොරොන්දුවක් තිබෙනව. නමුත් අනෙක් පැත්තෙන් එහි තිබෙන ක්‍රියාමාර්ග වලට වෙනස්ව ගමන් කළ යුතුයි යන බලපෑමත් ආණ්ඩුව තුළ පැමිණ තිබෙනව. ඒ නිසා අප සභාවක් හැටියට මේ ආකාරයට සංහිඳියාවක් ඇති කර ගැනීමේ දිසාවට ආණ්ඩුව යොමු කල යුතුයි. ඒ පියවර ගත්තොත් මේ රටේ සංවර්ධනයන් කර ගැනීමට හැකි වන බැවින් ඒ පිළිබඳව කාගේත් සිත යොමු කරන්න යැයි ඉල්ලීම කරමින් මාගේ කතාව අවසන් කරනව...


# VCE English

**Chemistry, Biology**
**& Physics**
**Maths Methods, Further & Specialist Maths**
**English (Year 6 to 12)**
**Maths (Year 6 to 12)**

Biochemistry & Chemistry
All Undergraduate & Post Graduate Levels

Specialised Coaching for entrance tests/exams of
Popular schools

**Family & Multiple subject Discounts**

We Follow **VCAA** guidelines, **VELS & PoLT**

Fully Registered Teachers

**For further information call Sandya: 0402 503 398**

Bundoora Coaching College
University Hill
Bundoora

www.bundooracoachingcollege.com.au